## 1. ''දිරිය පියස'' නිවාස වැඩසටහන

නිවසක හිමිකාරීත්වය නොමැති බැවින් විවිධ අපහසුතාවයන්ට ලක්වන අඩු ආදායම්ලාභී ප්‍රජාව ඉලක්ක කරගනිමින් ඔවුන්ගේ නිවාස අවශ්‍යතාවය හඳුනාගෙන ඒ සඳහා මැදිහත් වී නිවාස පහසුකම් ලබා දෙමින් මේ වන විටත් සමෘද්ධි වැඩසටහන තුල සාර්ථක ලෙස ''දිරිය පියස'' නිවාස වැඩසටහන ක්‍රියාත්මක වේ. මෙම වර්ෂයේ ද නිවසකට රු.200,000/=ක් බැගින් මුදල් ප්‍රතිපාදන ප්‍රමාණයක් වෙන්කර ඇති අතර නිවාස 168 ක් ඉදිකිරීමට අපේක්ෂිතය.

- ඒ අනුව ඔබ දිස්ත්‍රික්කය සඳහා වෙන්වන නිවාස සංඛ්‍යාව ඇමුණුම් අංක 8හි දක්වා ඇත. එය පාදක කර ගනිමින් දිස්ත්‍රික් කාර්යාල මඟින් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස සඳහා නිවාස ගණනය කිරීම සිදුකළ යුතුවේ.

**<u>ප්‍රතිලාභීන් හඳුනාගැනීම</u>**

- මෙම නිවාස ප්‍රතිලාභීන් තෝරා ගැනීමේ දී 2021 වර්ෂයේ සවිබල ගැන්වීමට නියමිත පවුල් මූලික කොටගත යුතු වේ. ඒ තුළ අදාල නිර්ණායක සපුරාලන ප්‍රතිලාභීන් නොමැති නම් ඉදිරි වර්ෂ එකකදී හෝ දෙකක් ඇතුළත ආර්ථික සංවර්ධනය තුළින් ජීවන තත්ත්වය උසස් කර සවිබල ගැන්වීමේ ප්‍රවේශයට යොමු විය හැකි පවුල් තෝරාගැනීම සුදුසු වේ. එවැනි පවුල් සඳහා ආර්ථික වශයෙන් ශක්තිමත් කෙරෙන ජීවනෝපාය සංවර්ධන ව්‍යාපෘති හඳුන්වා දෙමින් අදාල කාලය තුළදී සවිබල ගැන්වීමේ ඉලක්කය සපුරාලීමට අඛණ්ඩව පසුවිපරම් කරමින් මෙහෙයවීම ඉතා ඵලදායී බව සඳහන් කරමි.

- නමුත් අදාල නිර්ණායක සපුරාලන ආර්ථික හා සාමාජීය වශයෙන් අවාසි සහගත තත්ත්වයට පත්ව ඇති සවිබල ගැන්විය නොහැකි පවුල් ද ඉලක්ක කරගත යුතු අතර නිවාස ප්‍රතිලාභීන් තෝරා ගැනීමේදී අදාල නිර්ණායක යටතේ වඩාත්ම සුදුසු ප්‍රතිලාභීන් තෝරා ගත යුතුය.

- සෑම නිවාස ප්‍රතිලාභියෙක් පිළිබඳවම මූලික තොරතුරු වාර්තා ලබා ගත යුතු වේ. එය ඇමුණුම් අංක 1.A පරිදි ම සකස් විය යුතුය. පත්‍රිකාව සම්පූර්ණ කිරීම අදාල ග්‍රාම නිලධාරී වසමේ සමෘද්ධි සංවර්ධන නිලධාරී විසින් සිදු කළ යුතු අතර මෙම වාර්තාව සමඟ **ප්‍රතිලාභියා දැනට සිටින නිවස සම්පූර්ණයෙන් විදහා දැක්වෙන පැහැදිලි ඡායාරූපයක් ලබා දීම අත්‍යාවශ්‍ය වේ.** හිමිකාරිත්වය පිළිබඳව නීත්‍යානුකූලව ඉඩමේ ඔප්පුවක් නොමැති ප්‍රතිලාභීන් තම හිමිකාරිත්වය සඳහා නිරවුල් ලිඛිත සාක්ෂියක් ඉදිරිපත් කල යුතු වේ. මෙම ප්‍රතිලාභීන්ගේ සියළු වාර්තා ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ ද පිටපතක් සහිතව දිස්ත්‍රික් ලේකම් කාර්යාලය සතුව තිබිය යුතු අතර, අදාල නාම ලේඛනය ( ඇමුණුම් අංක 01 B අනුව ) හා ඡායාරූප කට්ටලය පමණක් 2021.04.30 දිනට පෙර ප්‍රධාන කාර්යාලය වෙත ලැබීම ප්‍රමාණවත් වේ.

- මෙහි දී නිවාස ප්‍රතිලාභීන්ගේ නිවැරදි නාම ලේඛනයම ලබා දීමට බෙහෙවින්ම සැලකිලිමත් විය යුතු අතර පසුව සංශෝධනය වන ප්‍රතිලාභීන් සිටී නම් එම සංශෝධනය දිස්ත්‍රික් ලේකම් විසින් අනුමත කිරීමෙන් අනතුරුව ප්‍රධාන කාර්යාලය වෙත ලිඛිතව ලබා දිය යුතුය. සියලුම නිවාස ඉදිකිරීමෙන් අනතුරුව එක් එක් ඉදිකළ නිවාස දැක්වෙන පැහැදිලි ඡායාරූප සමඟ නාම ලේඛනය 2021.11.15 දිනට පෙර ප්‍රධාන කාර්යාලය වෙත ලැබීමට සැලැස්විය යුතු වේ.

- අදාල නිර්ණායක වලට පටහැනි ලෙස ප්‍රතිලාභීන් තෝරා ගැනීම කිසි ලෙසකින් හෝ සිදු නොකළ යුතු අතර, ඒ සම්බන්ධයෙන් මනා විමසිලිමත්භාවයකින් හා වගකීමකින් යුතුව සියළු නිලධාරින් කටයුතු කළ යුතු වේ.

__සහභාගීත්වය__

මෙම නිවාස ඉදිකිරීමේ දී පවුලේ දායකත්වය හා කැපවීම අත්‍යාවශ්‍ය හා ප්‍රධාන කොට සැලකිය යුතුය. මන්ද තම නිවස ඉදිකිරීමේ දී එම ප්‍රතිලාභීන් ලබන අත්දැකීම් සම්භාරය, සමාජ වගකීම හා පුද්ගල අභිමානය ගොඩනැඟීම තුළින් නිවාස තෘප්තිය සමග තම කුටුම්භය තුළ සුරක්ෂිතතාව තහවුරු කර ගනිමින් කායික මානසික සහනයක් ලබා ගැනීම මගින් පුද්ගල ආධ්‍යාත්මික සංවර්ධනය තුළින් ජීවන තත්ත්වය උසස් කර ගැනීම ප්‍රධාන අරමුණක් වන බැවිනි. එනිසා ප්‍රතිලාභීන් තෝරා ගැනීමේ දී ඔවුන්ගේ කැපවීම පිළිබඳව ද සැලකිලිමත් වීම අත්‍යාවශ්‍ය වේ.

ඊට අමතරව පරිත්‍යාගශීලීන්, හිතවතුන්, අසල්වැසියන්, ප්‍රජාමූල සංවිධානවල සාමාජිකයින්ගේ සහභාගීත්වය හා දායකත්වය ලබා සාමූහික ප්‍රයත්නයකින් නිවස සම්පූර්ණ කිරීම වඩාත් යෝග්‍ය වේ.

__ප්‍රතිලාභීන් තෝරා ගැනීමේ නිර්ණායක__

1. ඉඩමක් හිමි එහෙත් ස්ථිර නිවසක් අහිමිව තාවකාලික හෝ අනාරක්ෂිත නිවසක ජීවත්වන සමෘද්ධි ප්‍රතිලාභී හෝ අඩු ආදායම්ලාභී පවුලක් වීම.
2. පවුලේ උපයන්නා මියගිය හෝ අක්‍රිය තත්ත්වයේ ඇති කාන්තා මූලික පවුලක් වීම.
3. ගැහැණු දරුවන් වැඩිපුර සිටින හෝ ආබාධිත දරුවන් සිටින පවුලක් වීම
4. දෙමාපියන් අහිමි පාසල් යන වයසේ පසුවන තම භාරකරුවන් ලෙස ආච්චි හෝ සීයා ළඟ යැපෙන දරුවන් ඇති පවුලක් වීම.
5. පවුලේ සාමාජිකයෙකු වකුගඩු රෝගී තත්වයෙන් පසුවන පවුලක් වීම ( මෙහිදී වකුගඩු රෝගයෙන් පීඩා විඳින අයෙකු බව බව වෛද්‍ය වාර්තා මගින් සනාථ කරගත යුතු අතර මාතලේ, ත්‍රිකුණාමලය, අනුරාධපුරය, පොලොන්නරුව, මොණරාගල, කුරුණෑගල, වව්නියාව, බදුල්ල, හම්බන්තොට හා මුලතිව් දිස්ත්‍රික්කවලට අදාල වේ.)

__තෝරා ගැනීමේ ක්‍රියාවලිය හා අදාල නිලධාරීන්__

ප්‍රතිලාභීන් තේරීමේදී අවම වශයෙන් ඉහත එක් නිර්ණායකයක් හෝ සපුරා තිබීම අනිවාර්ය වේ. නිර්ණායක එකකට වඩා සපුරාලන ප්‍රතිලාභීන් ද සිටිය හැකි බැවින් ප්‍රමුඛතා ලේඛනයක් සකසා එයින් වඩාත්ම සුදුසු ප්‍රතිලාභීන් තෝරා ගත යුතුය. එසේ තෝරා ගැනීමේදී ග්‍රාම නිලධාරී වසම්, ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ හා දිස්ත්‍රික් යන අදියරයන් වලදී සැදුම්ලන කමිටු නියෝජනය වන නිලධාරීන් පහත පරිදි වේ.

| අනු අංකය | අදියර | කමිටුව සඳහා අදාල නිලධාරීන් |
|---|---|---|
| 01 | ග්‍රාම නිලධාරී වසම් මට්ටම<br>__මූලික තෝරා ගැනීම__ | සමෘද්ධි සංවර්ධන නිලධාරී, ග්‍රාම නිලධාරී,<br>ප්‍රජා මූල සංවිධාන නියෝජිත, සමාජ සංවර්ධන සහකාර |

| | | |
|---|---|---|
| 02 | ප්‍රාදේශීය කොට්ඨාස මට්ටම<br>නිර්දේශ කිරීම | ප්‍රාදේශීය ලේකම්, මූලස්ථාන කළමනාකරු /කළමනාකාර අධ්‍යක්ෂ , අදාල කලාප කළමනාකරු, සමාජ සංවර්ධන සහකාර |
| 03 | දිස්ත්‍රික් මට්ටම<br>අනුමත කිරීම | දිස්ත්‍රික් ලේකම්, දිස්ත්‍රික් සමෘද්ධි අධ්‍යක්ෂ<br>දිස්ත්‍රික් සමාජ සංවර්ධන හා පරිසර විෂයය කළමනාකරු<br>දිස්ත්‍රික් කාර්යාලයේ සමාජ සංවර්ධන සහකාර |

ප්‍රාදේශීය සම්බන්ධීකරණ කමිටුවේ අනුමැතිය ලද ප්‍රතිලාභී ලැයිස්තුව දිස්ත්‍රික් ලේකම් වෙත ඉදිරිපත් කිරිමෙන් අනතුරුව දිස්ත්‍රික් ලේකම් විසින් අනුමැතිය හා ප්‍රතිපාදන ලබා ගැනිම සඳහා දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුව වෙත ඉදිරිපත් කළ යුතුය.

වැඩසටහන ක්‍රියාත්මක කිරිමේ වගකීම හා කාල රාමුව

දිරිය පියස නිවාස වැඩසටහන ක්‍රියාත්මක කිරිමේදී ඉහත නිර්ණායක හා වගකීම් පැවරී ඇති ආකාරයට අදාල කටයුතු සිදු කළ යුතුය. අවශ්‍ය අවස්ථාවලදී තාක්ෂණික උපදෙස් හා සහයෝගය ලබා ගනිමින් කටයුතු කළ යුතු අතර සමාජ සංවර්ධන සහකාර නිලධාරින් විසින් අදාල සම්බන්ධීකරණය හා පසු විපරම් කටයුතු සිදු කළ යුතු වේ. මෙහිදී අදාල වසම්භාර සමෘද්ධි සංවර්ධන නිලධාරී විසින් පරිත්‍යාගශීලීන් හා ප්‍රජාවගේ සහයෝගය ලබා ගනිමින් සුරක්ෂිතභාවය සහිතව සාර්ථක නිවාස ව්‍යාපෘතියක් නිම කිරීමට ඍජුවම සම්බන්ධ විය යුතු වේ.

මූල්‍ය ප්‍රතිපාදන ලබාදීම හා වාරික නිදහස් කිරීම.

| වාරිකය | මුදල(රු:) | නිවස ඉදිකෙරෙන අදියරයන් |
|---|---|---|
| පළමු | රු.75,000/= | අත්තිවාරම් හා බිත්ති බැදීම |
| දෙවන | රු.75,000/= | වහලය සෙවිලි කිරීම |
| තෙවන | රු.50,000/= | වැඩ අවසන් කිරීම |

වසම් මට්ටමින් තෝරාගත් නිවාස ප්‍රතිලාභීන්ට, අදාල තාක්ෂණික නිලධාරියෙකුගේ සහතිකය මත ඉහතින් සඳහන් අදියරයන්ට නියමිත වැඩ කොටස් නිම කළ බවට සහතික කිරීමෙන් පසු ප්‍රතිපාදන නිදහස් කළ හැකිය.''දිරිය පියස'' නිවාස වැඩසටහන සාර්ථක කර ගැනීම සඳහා දිස්ත්‍රික්කයේ සියලුම නිලධාරීන් දක්වන සහයෝගය ඉතා කෘතවේදීව අගය කරමි

ඇමුණුම් අංක 1 A

නිවාස අහිමි පුද්ගලයින් සඳහා සමෘද්ධි සංවර්ධන වැඩසටහන යටතේ නිවාස ලබා දීමේ

## මූලික තොරතුරු සමීක්ෂණ පත්‍රය.

1.0 ගෘහය පිළිබඳ මූලික තොරතුරු:

1.1 දිස්ත්‍රික්කය ................................ 1.2 ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය ............................

1.3 අදාල ප්‍රජාමූල බැංකු සමිතිය ................................ 1.4 කලාපය ............................

1.5 ග්‍රාම නිලධාරී වසම ................................ 1.6 සමෘද්ධි බැංකු සංගමය ............................

1.7 ග්‍රාම නිලධාරී වසම භාර සමෘද්ධි සංවර්ධන නිලධාරියාගේ නම හා දුරකථන අංකය:- ............................................................................................................................................

2.0 පවුල පිළිබඳ මූලික තොරතුරු:

| අනු අංකය | සම්පූර්ණ නම | ගෘහ මූලිකයාට ඇති නෑදෑකම | ස්ත්‍රී/ පුරුෂ භාවය | වයස (අවු:) | විවාහක/ අවිවාහක බව | අධ්‍යාපන මට්ටම | රැකියාව | පු.ලි.දෙ. හැඳුනුම්පත් අංකය |
|---|---|---|---|---|---|---|---|---|
| | | | | | | | | |
| | | | | | | | | |
| | | | | | | | | |
| | | | | | | | | |
| | | | | | | | | |

2.1 සමෘද්ධි සහනාධාරලාභියෙක් ද ? ....................................

2.2 සමෘද්ධි සහනාධාරලාභියෙක් නම් සහනාධාරයේ වටිනාකම රු:-...............................................

2.3 වෙනත් මහජන ආධාර ලැබෙන්නේ නම් එම ආධාරය හා වටිනාකම:-........................................

2.4 දුරකථනයක් ඇත්නම් අංකය:-…………………………………………………

3.0 ඉඩම පිළිබඳ මූලික තොරතුරු:

3.1 පදිංචි ඉඩමේ මූලික අයිතිය:-

| 1.සින්නක්කර | 2.කුලී පදනම | 3.බදු පදනම | 4.අනවසර | 5.ඥාතියෙකුගේ | 6.වෙනත් |
|---|---|---|---|---|---|
| | | | | | |

3.2 නිවසේ ස්වභාවය:-

| ස්ථිර | අර්ධ ස්ථිර | තාවකාලික |
|---|---|---|
| | | |

4.0 පවුලේ සාමාජික තොරතුරු:

4.1 ගෘහ මූලිකයා :

| 1.ජීවත්ව සිටී | 2.මියගොස් | 3.ආබාධිත | 4.අක්‍රිය | 5.වෙනත් |
|---|---|---|---|---|
| | | | | |

| | | | | |
|---|---|---|---|---|
| 4.2 ළමයින් පාසල් යන්නේ නම් සංඛ්‍යාව :- | ඔව් | | නැත | |
| 4.3 ආබාධිත දරුවන් සිටී නම් සංඛ්‍යාව:- | ඔව් | | නැත | |
| 4.4 නිදන්ගත රෝග සහිත පවුලේ සාමාජිකයන් සිටී නම්:- | ඔව් | | නැත | |
| 4.5 පවුලේ කිසිවෙක් මත්ද්‍රව්‍ය/දුම්වැටි භාවිතා කරන්නේ ද | ඔව් | | නැත | |

4.6 සවිබල ගැන්වීම -

| මෙම වසර තුළදී | ඉදිරි වසර 1 හෝ 2 තුළදී | වෙනත් |
|---|---|---|
| | | |

5.තෝරාගැනීමට පදනම් කරගත් නිර්ණායක - ....................................(අදාල අංකය සඳහන් කරන්න)

1. ඉඩමක් හිමි එහෙත් ස්ථිර නිවසක් අහිමිව තාවකාලික හෝ අනාරක්ෂිත නිවසක ජීවත්වන සමෘද්ධි ප්‍රතිලාභී හෝ අඩු ආදායම්ලාභී පවුලක් වීම.
2. පවුලේ උපයන්නා මියගිය හෝ අක්‍රිය තත්ත්වයේ ඇති කාන්තා මූලික පවුලක් වීම.
3. ගැහැණු දරුවන් වැඩිපුර සිටින හෝ ආබාධිත දරුවන් සිටින පවුලක් වීම
4. දෙමාපියන් අහිමි පාසල් යන වයසේ පසුවන තම භාරකරුවන් ලෙස ආච්චි හෝ සීයා ළඟ යැපෙන දරුවන් ඇති පවුලක් වීම.
5. පවුලේ සාමාජිකයෙකු වකුගඩු රෝගී තත්වයෙන් පසු වන පවුලක් වීම.

පවුලේ සාමාජිකයෙකු වකුගඩු රෝගී තත්වයෙන් පසුවන පවුලක් වීම ඉහත තොරතුරු සත්‍ය හා නිවැරදි බවටත්, නිවාස ආධාරය ලැබීමෙන් අනතුරුව නිවස ඉදිකර ගැනීම සඳහා කැපවී කටයුතු කරන බවටත් සහතික වෙමි.

................................... ......................................

දිනය අයදුම්කරුගේ අත්සන

| ග්‍රාම නිලධාරි වසම භාර සමෘද්ධි සංවර්ධන නිලධාරි නිර්දේශය | අදාල ප්‍රජාමූල සමිතියේ සභාපතිගේ නිර්දේශය | කලාප කළමනාකරු නිර්දේශය |
|---|---|---|
| නම.................................. | නම................................ | නම................................... |
| අත්සන.............................. | අත්සන............................ | අත්සන............................... |
| දිනය................................. | දිනය............................... | දිනය............................... |

| **මූලස්ථාන කළමනාකරු/ කළමනාකර අධ්‍යක්ෂගේ නිර්දේශය** | ප්‍රාදේශීය ලේකම්ගේ නිර්දේශය | දිස්ත්‍රික් ලේකම්/දිස්ත්‍රික් සමෘද්ධි අධ්‍යක්ෂගේ අනුමැතිය |
|---|---|---|
| **නම..................................** | නම................................ | නම................................... |
| **අත්සන..............................** | අත්සන............................ | අත්සන............................... |
| **දිනය.................................** | දිනය............................... | දිනය............................... |

## 2. දුම්වැටි හා මත්ද්‍රව්‍ය නිවාරණය, ගෘහ කලමනාකරණය හා සතුටු පවුල් වැඩසටහන

### හැඳින්වීම

වර්තමාන පවුල් ඒකකය දෙස අවධානය යොමු කර බලන විට ඔවුන් යම් පමණකින් ආර්ථික සංවර්ධනය අත්පත් කර ගත්තද දුම්වැටි භාවිතය , මත්ද්‍රව්‍ය හා මත්පැන්වලට ගොදුරු වීම නිසා සමාජීය සංස්කෘතිකමය වශයෙන් අත්පත් කර ගෙන ඇති පරාජයන් අතිමහත්ය. එබැවින් ආර්ථික සංවර්ධනයට සමගාමීව යමින් සමාජීය සංවර්ධන ඉලක්කයන් සාක්ෂාත් කර ගැනීමට ප්‍රජාවගේ අවබෝධය දියුණු කිරීම තුළින් තෘප්තිමත් පවුල් ජීවිතයක් ගත කිරීමේ වැදගත්කම, මත්ද්‍රව්‍ය හා මත්පැන්වලින් අත්මිදීම, ගෘහ කළමනාකරණය යන තේමාවන් යටතේ 2021 වර්ෂයේ පවුල් 24,825 ක් දැනුවත් කිරිමට අපේක්ෂිතය.

මේ යටතේ ඔබ දිස්ත්‍රික්කයේ මත්ද්‍රව්‍ය හා දුම්වැටි භාවිතයට හුරු වී ඇති හා පවුල් ඒකකය තුළ අභ්‍යන්තර කළමනාකාරිත්වය පිළිබඳ ගැටළු ඇති පවුල් ඒකක, ඉලක්ක ප්‍රජාව විය යුතු අතර ඔවුන් මුහුණ දෙන ගැටළු නිවැරදිව අවබෝධ කරගෙන ප්‍රාදේශිය ලේකම් කොට්ඨාශ මට්ටමින් වැඩසටහන් සංවිධානය කළ යුතුය. වැඩසටහන පැවැත්වීමට පෙර එක් එක් පවුල් ඒකකය මුහුණ දෙන ගැටළු නිවැරදිව හඳුනා ගෙන ලේඛන ගත කර එම තොරතුරු මත පදනම්ව වැඩසටහන් සැලසුම් කළ යුතුය.

මෙම වැඩසටහන ක්‍රියාත්මක කිරීමේදී එක් පුද්ගලයකුට සංග්‍රහ වියදම්, ලිපිද්‍රව්‍ය හා සම්පත්දායක දීමනා ලෙස රුපියල් 400 ක් වන සේ ප්‍රාදේශිය ලේකම් කොට්ඨාශයකට රුපියල් 30,000 ක ප්‍රතිපාදන වෙන්කර ඇත. ඒ අනුව අවම වශයෙන් ප්‍රාදේශිය ලේකම් කොට්ඨාසයකට පුද්ගලයින් 75 බැගින් වන පරිදි මෙම වැඩසටහන හා බද්ධ කරගත යුතුය. අවම වශයෙන් පැය 05 ක් වත් ආවරණය වන පරිදි මත්ද්‍රව්‍ය හා දුම්වැටි භාවිතය වැළැක්වීම, ගෘහ කළමනාකරණය යන විෂයන් යටතේ න්‍යායාත්මක මෙන්ම ප්‍රායෝගික දැනුම ඇති වඩාත් සුදුසු සම්පත්දායකයින් සම්බන්ධ කරගනිමින් ඵලදායි එක්දින වැඩසටහන් පැවැත්වීමට කටයුතු කළ යුතුය.

### වැඩසටහනේ විෂය අන්තර්ගතය.

1. මත්ද්‍රව්‍ය හා දුම්වැටි භාවිතයෙන් වැලකීම
2. ගෘහ කළමනාකරණය

### වැඩසටහන ක්‍රියාත්මක කිරිමෙන් අපේක්ෂිත ප්‍රතිඵල

1. ප්‍රාදේශිය ලේකම් කොට්ඨාශ මට්ටමින් පුහුණු වැඩසටහන සඳහා හඳුනා ගන්නා පවුල් පිළිබඳ මාස 06 ක් අඛණ්ඩව අධික්ෂණය කර ඉලක්ක ජය ගැනීමට පෙළඹවීම.
2. ප්‍රාදේශිය ලේකම් කොට්ඨාසයකින් අවම වශයෙන් පවුල් 20 ක් මත්ද්‍රව්‍ය හා දුම්වැටි භාවිතයෙන් මුදවා ගැනීම හා එම පවුල් අතරින් පවුල් 05 ක් පිළිබඳ තොරතුරු සිද්ධි අධ්‍යයන ලෙස වාර්තා කිරීම.
3. ප්‍රාදේශිය ලේකම් කොට්ඨාසයකින් දුම්වැටි අලෙවි කරන වෙළඳසැල් 15 ක අලෙවිය නතර කිරීම හා එම අලෙවි සැල් පිළිබඳ තොරතුරු වාර්තා කිරීම
4. පාසල් හා ආගමික ස්ථාන අවට අලෙවිකරණ කුඩා කඩ, ජංගම වෙළඳුගේ අලෙවිය නතර කිරිම හා එම අලෙවිහල් පිළිබඳ තොරතුරු වාර්තා කිරිම.

## 03. බෝනොවන රෝග අවම කිරීම සඳහා කාබනික ආහාර ප්‍රවර්ධන වැඩසටහන

දුප්පත්කම අවම කිරීම සඳහා දුප්පතුනගේ කායික නිරෝගීභාවය පැවැතිම අත්‍යවශ්‍ය සාධකයකි. මිනිසුන් රෝගී වීම ස්වභාවික වුවත් ඔවුන්ගේ චර්යාවන්ගේ බලපෑම මත කිසිවෙක් රෝගී වන්නේ නම් චර්යාවන් වෙනස් කිරීමෙන් එය වලක්වා ගත හැකිය. වර්තමානයේ ශ්‍රී ලංකීක සමාජය මුහුණ දී ඇති බෝනොවන රෝග වලට හේතු වී ඇත්තේ ද මානව චර්යාවන්ය.

බෝනොවන රෝග ලෙස ප්‍රධාන වශයෙන් හඳුනාගෙන ඇත්තේ පිළිකා, දියවැඩියාව, හෘද රෝග, නිදන්ගත පෙනහළු රෝග හා වකුගඩු රෝග යනාදියයි. අද මෙම රෝගයන්ට වයස් භේදයකින් තොරව කුඩා ළමුන් පවා ගොදුරු වන ප්‍රවනතාවයක් ඇත. දිනකට රෝගීන් 80 ක් පමණ වාර්තා විමෙන් ඒ බව පැහැදිලි වේ.

මෙම තත්ත්වයන්ට හේතු වී ඇත්තේ වස විස අන්තර්ගත ආහාර පරිභෝජනය කිරීම, ක්ෂණික ආහාර වර්ග අනුබව කිරීම, මත්ද්‍රව්‍ය හා දුම්වැටි භාවිතය, අපිරිසිදු ජලය පානය කිරීම හා ආතතිය වැනි සාධකයන්ය. මේ සියලු තත්ත්වයන් පුද්ගල ආකල්ප හා චර්යාවන් වෙනස් කිරිමෙන් අවම කළ හැකිය. එමෙන්ම දේශිය වශයෙන් නිෂ්පාදනය කළ හැකි හා සපයා ගත හැකි වසවිස නොමැති ආහාර වර්ග පරිභෝජනය ඉහල දැමිය හැක.

ඉහත අරමුණ සාක්ෂාත් කර ගැනීමේ අරමුණින් ප්‍රාදේශිය ලේකම් කොට්ඨාශ මට්ටමින් බෝ නොවන රෝගී තත්ත්වයන්ට ගොදුරු වී ඇති පුද්ගලයන් හඳුනා ගෙන වැඩසටහන් 331 පැවැත්වීමට අපේක්ෂිතය.වැඩසටහන් ක්‍රියාත්මක කිරීමේදී එක් පුද්ගලයකුට සංග්‍රහ වියදම්, ලිපිද්‍රව්‍ය හා සම්පත්දායක දීමනා ලෙස රුපියල් 400 ක් වන ලෙස එක් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයකට රු 30,000/- ක මුදලක් වන අයුරින් දිස්ත්‍රික්කය සඳහා ප්‍රතිපාදන වෙන්කර ඇත. ඒ අනුව අවම වශයෙන් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයකට පුද්ගලයින් 75 බැගින් වන පරිදි මෙම වැඩසටහන හා බද්ධ කරගත යුතුය. මෙම වැඩසටහන් ක්‍රියාත්මක කිරීමේදී හුදු දැනුවත් කිරීමේ වැඩසටහනක් පමණක් ලෙස නොසලකා හඳුනාගත් පවුල් කායික නිරෝගීතාවය වර්ධනය කිරීමේ අරමුණින් වැඩසටහන් සංවිධානය කළ යුතු අතර වැඩසටහන් ක්‍රියාත්මක කිරීමෙන් අනතුරුව ප්‍රගතිය නිශ්චිත වශයෙන් වාර්තා කළ හැකිවන පරිදි අවශ්‍ය සැලසුම් සකස් කළ යුතුය.

තෝරාගත් පවුල්වල ප්‍රගතිය පිළිබඳ නිරන්තර පසු විපරම් කළ යුතු අතර පළමු වැඩසටහනේ පුද්ගල අධ්‍යයනවලදී හඳුනාගත් ගැටළු වලට විසඳුම් ලැබෙන ලෙස දෙවන පුහුණු වැඩසටහන් සංවිධානය කළ යුතුය. ඒ සඳහා ඔබ ප්‍රදේශයේ සහාය සේවාවලාභී සහයෝගය ලබා ගත යුතු වේ. එහිදී ප්‍රතිලාභින්ගේ ප්‍රගතිය පිළිබදව විමසා බැලිය යුතු අතර ඒ ඒ පුද්ගලයා සහ පවුල කෙරෙහි විශේෂ අවධානය යොමු කරමින් කටයුතු කළ යුතුය. වැඩසටහනට වෙන් කළ මුදල් අවසන් වුවද තෝරාගත් පවුල් කායික නිරෝගීතාවය වර්ධනය කිරීමට අනෙකුත් සහාය ආයතන හා එක්ව පසු විපරම් කටයුතු අඛණ්ඩව සිදුකිරීම අවශ්‍ය වේ.

## 04. සමෘද්ධි ප්‍රතිලාභීන්ගේ මානසික සෞඛ්‍යය වැඩි දියුණු කිරීමේ වැඩසටහන

සමෘද්ධි වැඩසටහන හා බද්ධ වී සිටින ප්‍රජාවගේ මානසික සෞඛ්‍යය වැඩි දියුණු කිරීම සඳහා ඔවුන්ගේ දැනුවත්භාවය වැඩි දියුණු කිරීමත්, අවශ්‍ය අවස්ථාවලදී අදාල ආයතන හා සම්බන්ධීකරණ කටයුතු සිදුකරමින් ඔවුන් මානසික වශයෙන් සවිබලගැන්වීමත් මෙමගින් අපේක්ෂිතය.

එමෙන්ම සමෘද්ධි ව්‍යාපාරය වටා ඒකරාශි වී සිටින දුප්පත් ප්‍රජාව සවිබල ගැන්වීමේ දී ඔවුන්ගේ ආර්ථික හා සමාජීය මට්ටම ඉහල නැංවීම සඳහා මානසික සවිබල ගැන්විම ඉතා වැදගත් සාධකයක් බව සංවර්ධන මනෝවිද්‍යාඥයින් පෙන්වා දී ඇත. ඔවුන්ට අනුව සංවර්ධනය යනු කායික, මානසික, ආර්ථික , සමාජීය, අධ්‍යාත්මික හා පාරිසරික යන සියලු අංශයන්ගෙන් සම්පුර්ණ විය යුතු බවයි. මෙයින්ද ප්‍රධානම සාධකය වන්නේ මානසික සංවර්ධනයයි.

දිළිඳු ප්‍රජාව තුළ දක්නට ලැබෙන සුවිශේෂී ලක්ෂණය නම් ඔවුන්ගේ ආර්ථික දුරිදතාවයට වඩා සමාජ ප්‍රතිරෝදකයන් වන මත්ද්‍රව්‍ය, සමාජ අපචාර, ප්‍රචණ්ඩත්වය, ගෘහස්ථ හිංසනය වැනි ගැටළු වල ගොදුරු බවට පත්වීමයි. ඉන්පසු ඒ තුළින් ඇතිවන සමාජ ආර්ථික ආර්බුදයන් හමුවේ මානසික පීඩනය, කලකිරීම, හුදකලාබව, ආතතිය , සියදිවි නසා ගැනීම වැනි සමාජ ප්‍රශ්න ගණනාවකට මුහුණ දීමට සිදුවේ. මෙවැනි සමාජ ප්‍රශ්න වලින් පීඩා විඳිමින් ජීවත්වන ප්‍රජාවගේ මානසික තත්ත්වය හා ඔවුන් මුහුණ පා ඇති ගැටළු හඳුනාගෙන ඒවායින් මිදීම සඳහා අවශ්‍ය මඟපෙන්වීම සඳහා උපදේශනය හා වෘත්තිය මාර්ගෝපදේශකත්වය සපයමින් ජීවිතයේ යථාබෝධය ලබාදීම උපදේශනයේ අරමුණයි.

ඉහත සඳහන් පරිදි මානසික ගැටළු ඉලක්ක කර වැඩසටහන් ක්‍රියාත්මක කිරීමේදී එක් පුද්ගලයකුට සංග්‍රහ වියදම්, ලිපිද්‍රව්‍ය හා සම්පත්දායක දීමනා ලෙස රුපියල් 400 ක් වන ලෙස එක් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයකට රු 30,000ක මුදලක් වන අයුරින් දිස්ත්‍රික්කය සඳහා ප්‍රතිපාදන වෙන්කර ඇත. ඒ අනුව අවම වශයෙන් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයකට පුද්ගලයින් 75 බැගින් වන පරිදි මෙම වැඩසටහන හා බද්ධ කරගත යුතුය. මෙම වැඩසටහන් ක්‍රියාත්මක කිරීමේදී හුදු දැනුවත් කිරීමේ වැඩසටහනක් පමණක් ලෙස නොසලකා හඳුනාගත් පවුල් මානසික වශයෙන් සවිබලගැන්වීම අරමුණින් වැඩසටහන් සංවිධානය කළ යුතු අතර වැඩසටහන් ක්‍රියාත්මක කිරීමෙන් අනතුරුව ප්‍රගතිය නිශ්චිත වශයෙන් වාර්තා කළ හැකිවන පරිදි අවශ්‍ය සැලසුම් සකස් කළ යුතුය.

තෝරාගත් පවුල්වල ප්‍රගතිය පිළිබඳ නිරන්තර පසු විපරම් කළ යුතු අතර පළමු වැඩසටහනේ පුද්ගල අධ්‍යයනවලදී හඳුනාගත් ගැටළු වලට විසඳුම් ලැබෙන ලෙස දෙවන පුහුණු වැඩසටහන් සංවිධානය කළ යුතුය. ඒ සඳහා ඔබ ප්‍රදේශයේ සහාය සේවාවලාභී සහයෝගය ලබා ගත යුතු වේ. එහිදී ප්‍රතිලාභින්ගේ ප්‍රගතිය පිළිබඳව විමසා බැලිය යුතු අතර ඒ ඒ පුද්ගලයා සහ පවුල කෙරෙහි විශේෂ අවධානය යොමු කරමින් කටයුතු කළ යුතුය. වැඩසටහනට වෙන් කළ මුදල් අවසන් වුවද තෝරාගත් පවුල් මානසික වශයෙන් ශක්තිමත් වෙනතුරු අනෙකුත් සහාය ආයතන හා එක්ව පසු විපරම් කටයුතු අඛණ්ඩව සිදුකිරීම අවශ්‍ය වේ.

## 5. සමෘද්ධි කැකුළු ළමා සමාජ හා සංස්කෘතික වැඩසටහන

දැයේ දරුවන්ගේ හෙට දවස සුරක්ෂිත කිරිමේ අරමුණ සාක්ෂාත් කර ගැනීම මෙන්ම අනාගත වැඩ ලෝකයට ගැලපෙන අයුරින් දරුවන් නිර්මාණය කිරීම සඳහා වයස අවු 05 – 18 අතර වයසේ පසුවන දරුවන් ග්‍රාමීය මට්ටමින් සමෘද්ධි කැකුළු ළමා සමාජ වටා ඒකරාශී කරමින් ඔවුන් සමග විවිධ ක්‍රියාකාරකම්වල යෙදෙමින් දැනුම, ආකල්ප, කුසලතාවලින් පිරිපුන් ගුණ නුවණින් යුතු අභියෝග ජය ගත හැකි දරුවන් දැයට දායාද කිරීම මෙම වැඩසටහන තුළින් අපේක්ෂිතය.

ඒ සඳහා 2021 වසරේදී පහත පරිදි වැඩසටහන් ක්‍රියාත්මක කෙරේ.

### 5.1 සමෘද්ධි කැකුළු ළමා සමාජ සංස්කෘතික හා සාහිත්‍ය තරඟාවලිය.

මේ සම්බන්ධව උපදෙස් පත්‍රිකාව ඔබ වෙත ඉදිරියේදී නිකුත් කරනු ලැබේ.

### 5.2 සමෘද්ධි සංස්කෘතික කණ්ඩායම් ස්ථාපිත කිරිම

සෞන්දර්ය හැකියාවන්ගෙන් පිරිපුන් දරුවන්ගේ අනාගත අභිවෘද්ධිය ඉලක්ක කොට ගනිමින් සමෘද්ධි සංස්කෘතික කණ්ඩායම් ස්ථාපිත කිරිම පිළිබඳ සැලසුම් සකස් කරමින් පවතී. ඒ පිළිබඳ ඉදිරියේ දී උපදෙස් නිකුත් කිරිමට නියමිතය.

### 5.3 සමෘද්ධි කැකුළු ළමා සමාජ දරුවන්ගේ කියවීමේ කුසලතා වර්ධනය කිරීමේ වැඩසටහන - 2021

"කියවමු, නැණවත් වෙමු, දිවිය ජයගනිමු" තේමාව අනුව කියවීමෙන් පන්නරය ලැබූ දැනුමෙන් පෝෂිත ළමා පරපුරක් රටට දායාද කර දීම සඳහා විද්‍යානුකූල ක්‍රමවේදයන් අනුගමනය කරමින් අනාගත ළමා පරපුර තුළ කියවිමේ කුසලතා වර්ධනය කිරීම හා කියවීමේ රුචිකත්වය ඇති කරගැනීමට ඵලදායී බලය ලබා දීම සඳහා 2021 වසරේ දී මෙම වැඩසටහන වඩාත් ප්‍රතිඵලදායීව ක්‍රියාත්මක කිරීමට අපේක්ෂිතය.

2021 වසරේ දිස්ත්‍රික්කයේ ප්‍රාදේශිය ලේකම් කොට්ඨාශ මත පදනම්ව මෙන් දිවයින පුරා පුස්තකාල 86 විධිමත් ප්‍රමිතියකට අනුව සකස් කිරීම අපේක්ෂිතය. පුස්තකාලය ඉදිකිරිමෙන් පසු සමෘද්ධි කැකුළු ළමා සමාජ පුස්තකාල හඳුනා ගැනීම සඳහා ලබා දී ඇති නාම පුවරු සවිකිරිමට කටයුතු කිරීම වැදගත්ය.

දැනටමත් පුස්තකාල වෙත ලබා දී ඇති හා පරිත්‍යාග වශයෙන් ලැබී ඇති පොත් පත් ලේඛනගත කිරීම සඳහා ජාතික මට්ටමින් සකසා ඇති පරිග්‍රහණ ලේඛනයේ ආකෘතියක් දැනටමත් socialdev@divineguma.gov.lk ඊ-මේල් මගින් සියලුම දිස්ත්‍රික්ක වෙත යොමු කර ඇති අතර එය පහත පරිදි වේ.

එම පරිග්‍රහණ ලේඛනය සුදුසු පරිදි CR පොතක පිටු දෙකක සකසා පුස්තකාල තුළ පරිහරණය කරන පොත් විධිමත් පරිදි පරිග්‍රහණ ලේඛනගත කරන ලෙස දන්වමි.

**<u>පරිග්‍රහණ ලේඛනය</u>**

<u>சேர்ப்பு இடாப்பு</u>

<u>ACCESSION REGISTER</u>

| පරිග්‍රහණ අංක சேர்ப்பு எண் Accession Number | දිනය திகதி Date | කතෘ ஆக்கியோன் Author | ග්‍රන්ථ නාමය நூலின் பெயர் Tittle | ප්‍රකාශන ස්ථානය,ප්‍රකාශක,ප්‍ර. දිනය வெ.இடம் வெளியிடுவோர் வெ.தினம் Place of Publish, Publisher, Date of Publ.. | පිටු பக்கங்கள் Pages | මිල விலை Price | ලැබුණු මග மூலம் Source | වෙනත් කරුණු குறிப்புக்கள் Remarks |
|---|---|---|---|---|---|---|---|---|
| 0001 | | | | | | | | |
| 0002 | | | | | | | | |
| 0003 | | | | | | | | |

සමෘද්ධි කැකුළු ළමා සමාජ හරහා දරුවන් තුළ කියවීමේ පුරුද්ද ඇති කිරීම සඳහා ක්‍රම වේදයක් ඇති කිරීමේ වැදගත්කම අවධාරණය කරමින් ශ්‍රී ලංකා පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලය ඒකාබද්ධව නිර්මාණය කරන ලද කියවීමේ අත්පොත සමාජ සංවර්ධන සහකාරවරු මගින් සමෘද්ධි කැකුළු ළමා සමාජ දරුවන්ව දැනුම්වත් කිරීම උදෙසා හා කියැවීමේ රුචිකත්වය වර්ධනය කිරීම සඳහා එම පුස්තකාලවලට බෙදා හැරීමට සැලසුම්කර ඇති අතර ඒ පිළිබඳව ඉදිරියේදී ඔබව දැනුවත් කෙරෙනු ඇත.

ඇමුණුම 06

**<u>සනීපාරක්ෂක ( වැසිකිළි ) පහසුකම් සැපයීමේ වැඩසටහන :-</u>**

සනීපාරක්ෂක ( වැසිකිළි ) පහසුකම් නොමැති බැවින් විවිධ අපහසුතාවයන්ට ලක්වන සමෘද්ධිලාභී හා අඩු ආදායම්ලාභී ප්‍රජාව හඳුනා ගෙන සනීපාරක්ෂක (වැසිකිළි ) පහසුකම් ලබාදීමේ වැඩසටහනක් 2020 වර්ෂයේ සමාජ සංවර්ධන අංශය මගින් සැලසුම් කර සමාජ ආරක්ෂණ අරමුදලින් වැය දරමින් සමස්ත දිස්ත්‍රික්ක 25 ආවරනය කරමින් සාර්ථක ලෙස එම ව්‍යාපෘතිය ක්‍රියාත්මක විය.

මෙම 2021 වර්ෂයේද සමාජ සංවර්ධන අංශය සඳහා වෙන්වී ඇති භාණ්ඩාගාර ප්‍රතිපාදන යටතේ එක් වැසිකිළියකට රු.30,000/= බැගින් දිස්ත්‍රික්ක 25 ආවරණය වන පරිදි වැසිකිළි 500 ඉදිකිරීමට අපේක්ෂිතය. ප්‍රමුඛතාවය මත ප්‍රතිලාභීන් තෝරා ගත යුතු අතර සියළුම ප්‍රාදේශීය ලේකම් කොට්ඨා ආවරණය වන පරිදි එක් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයක් සඳහා අවම වශයෙන් එක් වැසිකිළියක් හෝ ලබා දිය යුතුය.

පසුගිය වර්ෂයේ වැසිකිළි ඉදිකිරීම සඳහා මගේ අංක DSD/HO/07/SD/04/02-SA හා 2020.02.20 , 2020.10.21 යන දිනවලින් නිකුත් කල උපදෙස් පත්‍රිකා අනුව ක්‍රියාත්මක කල ක්‍රමවේදයම අනුගමනය කල යුතු අතර මෙම වර්ෂයේ අදාල ප්‍රතිපාදන දිස්ත්‍රික් ලේකම් කාර්යාල වෙත නිදහස් කරනු ඇත.

**ප්‍රතිලාභීන් හඳුනා ගැනීමේදී පහත සඳහන් නිර්නායක සපුරා තිබීම පිළිබඳ විශේෂ අවධානය යොමුකළ යුතුවේ.**

1. ප්‍රතිලාභියා සනීපාරක්ෂක (වැසිකිළි) පහසුකම් නොමැති සමෘද්ධි හා අඩු ආදායම්ලාභියකු විය යුතුය.
2. වැසිකිළියක් ඉදිකිරීමට ප්‍රමාණවත් ඉඩමක හිමිකමක් ප්‍රතිලාභියා සතු වී තිබිය යුතු වේ.
3. මෙම වැසිකිළිය ඉදිකිරීමේදී ප්‍රතිලාභියාගේ දායකත්වය හා කැපවීම පිළිබඳ සැලකිළිමත්වීම අත්‍යාවශ්‍ය වේ.

යෝජිත සනීපාරක්ෂක (වැසිකිළි) වැඩසටහන ක්‍රියාත්මක කිරීමේ වගකීම හා කාල රාමුව පහත සඳහන් පරිදි වේ. සෑම ප්‍රතිලාභියෙකු පිළිබඳවම මූලික තොරතුරු වාර්තා ලබා ගත යුතු වන අතර එය ඇමුණුම් අංක 06 A පරිදි සකස් විය යුතුය. පත්‍රිකාව සම්පූර්ණ කිරීම අදාල ග්‍රාම නිළධාරි වසමේ සමෘද්ධි සංවර්ධන නිලධාරි සිදු කල යුතු අතර ප්‍රතිලාභීන් තෝරා ගැනීමේදී අදාල ප්‍රජාමූල සංවිධාන නිලධාරින්ගේ තහවුරුවක් විශේෂයෙන්ම ලබාගත යුතුය. මෙම ප්‍රතිලාභීන් ගේ සියළු වාර්තා අදාල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ පිටපතක් සහිතව දිස්ත්‍රික් ලේකම් කාර්යාලය සතුව තිබිය යුතු අතර නාමලේඛණ අදාල ඇමුණුමට අනුව **2021.03.30 දිනට පෙර** ප්‍රධාන කාර්යාලය වෙත ලැබීමට සැලැස්විය යුතු අතර ඒ සියළු කාර්යයන් පෙර පරිදි සිදුකල යුතුවේ.ආරම්භක අවස්ථාවේ හා නිමකළ වැසිකිළියේ ඡායාරූප ලබාගැනීම අනිවාර්ය වන අතර එම ඡායාරූප ප්‍රධාන කාර්යාලය වෙත ලබා දීමට කටයුතු කල යුතුවේ.

අනුමත ප්‍රතිලාභී නාම ලේඛණයේ යම්කිසි සංශෝධනයක් සිදුවන්නේ නම් එම ප්‍රතිලාභියාට සනීපාරක්ෂක (වැසිකිළි) ආධාර අනවශ්‍ය බව තහවුරු කළ යුතු වේ. සංශෝධනය වන ප්‍රතිලාභියා වෙනුවට ඉතා ඉක්මනින් ඒ සඳහා අදාල කලාපයේ ප්‍රමුඛතා ලේඛණයේ සිටින වෙනත් සුදුසු ප්‍රතිලාභියකුට අවස්ථාව ලබා දීම සුදුසු වේ. යෝජනා වන ප්‍රතිලාභියා අවශ්‍ය නිර්ණායක සපුරා තිබිය යුතු

අතර අදාල අයදුම්පත සම්පූර්ණ කළ යුතුය. එම ලේඛණ ප්‍රාදේශීය ලේකම් නිර්දේශකර කාර්යාලයේ පිටපතක් සහිතව දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ තිබිය යුතු අතර, **එම නිර්දේශිත සංශෝධනය වූ නාම ලේඛණ දිස්ත්‍රික් සමෘද්ධි අධ්‍යක්ෂ විසින් අනුමත කර පිටපතක් ප්‍රධාන කාර්යාලය වෙත යොමු කළයුතු වේ.** එසේ සංශෝධන සිදුකරන්නේ නම් පළමු වාරික මුදල ලබා දීමට ප්‍රථම සිදුකළ යුතු බව දන්වමි.

යෝජිත සනීපාරක්ෂක වැසිකිළි වැඩසටහන ක්‍රියාත්මක කිරීමේ වගකීම හා කාල රාමුව පහත පරිදි වේ.

| අනු අංකය | අදියර | කාල සීමාව | වගකීම |
|---|---|---|---|
| 01. | පළමු අධියර සඳහා ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය මට්ටමින් ප්‍රතිලාභීන් තෝරා ගැනීම. | 2021.03.30 දිනට පෙර | • ප්‍රදේශයේ විහාරාධිපති ස්වාමීන් වහන්සේලා, අනෙකුත් ආගමික පූජකතුමන්ලා<br>• පළාත් පාලන ආයතනවල මහජන නියෝජිතයින්<br>• සමෘද්ධි සංවර්ධන නිලධාරී<br>• ග්‍රාම නිලධාරී,<br>• ප්‍රජා සංවිධාන නායකයින්<br>• පවුල් සෞඛ්‍ය සේවා නිලධාරී |
| 02. | ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස මට්ටමින් නිර්දේශ කිරීම. | | • ප්‍රාදේශීය ලේකම්<br>• මුලස්ථාන කළමණාකරු /බැංකු සමිති කළමණාකරු , අදාල බැංකු කළමනාකරු, සමාජ සංවර්ධන සහකාර |
| 03. | දිස්ත්‍රික් මට්ටමින් අනුමත කිරීම හා ප්‍රධාන කාර්යාල වෙත තොරතුරු යොමු කිරීම. | | • දිස්ත්‍රික් ලේකම්/ දිස්ත්‍රික් සමෘද්ධි අධ්‍යක්ෂ<br>• දිස්ත්‍රික් සමාජ සංවර්ධන විෂයය කළමනාකරු<br>• දිස්ත්‍රික් කාර්යාලයේ සමාජ සංවර්ධන සහකාර |
| 04. | දිස්ත්‍රික් සඳහා මුදල් නිදහස් කිරීම. | 2021.04.15 දිනට පෙර | • ප්‍රධාන ගණකාධිකාරී, සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව.<br>• අධ්‍යක්ෂ (සමාජ සංවර්ධන ) |
| 05. | සනීපාරක්ෂක වැසිකිළි පළමු අදියර අවසන් කිරීම. | 2021.05.30 දිනට පෙර | • දිස්ත්‍රික් ලේකම්, දිස්ත්‍රික් සමෘද්ධි අධ්‍යක්ෂ,<br>• දිස්ත්‍රික් නි.අධ්‍යක්ෂ/ස.අධ්‍යක්ෂ,<br>• දිස්ත්‍රික් සමාජ සංවර්ධන විෂය |

<table>
<tr><td>06.</td><td>සනීපාරක්ෂක වැසිකිළි දෙවන අදියර අවසන් කිරීම.</td><td>2021.06.30<br>දිනට පෙර</td><td rowspan="2">කළමණාකරු<br>• දිස්ත්‍රික් කාර්යාලයේ සමාජ සංවර්ධන සහකාර<br>• ප්‍රාදේශීය ලේකම්<br>• මුලස්ථාන කළමණාකරු/ බැංකු සමිති කළමණාකරු, අදාල බැංකු කළමණාකරු, සමාජ සංවර්ධන සහකාර</td></tr>
<tr><td>07.</td><td>ප්‍රගතිය ප්‍රධාන කාර්යාලයට වාර්තා කිරීම.</td><td>2021.07.15<br>දිනට පෙර</td></tr>
</table>

ප්‍රාදේශීය සම්බන්ධීකරණ කමිටුවේ අනුමැතිය ලද ප්‍රතිලාභී ලැයිස්තුව දිස්ත්‍රික් ලේකම් වෙත ඉදිරිපත් කිරිමෙන් අනතුරුව දිස්ත්‍රික් ලේකම් විසින් අනුමැතිය හා ප්‍රතිපාදන ලබා ගැනිම සඳහා දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුව වෙත ඉදිරිපත් කළ යුතුය

ඇමුණුම් අංක 06 A

**සමෘද්ධිලාභී හා අඩු ආදායම්ලාභීන් සඳහා සනීපාරක්ෂක වැසිකිළි පහසුකම් සැපයීම - 2021**

**මූලික තොරතුරු සමීක්ෂණ පත්‍රය.**

2.0 ගෘහය පිළිබඳ මූලික තොරතුරු:

| | | | | | |
|---|---|---|---|---|---|
| 1.1 | දිස්ත්‍රික්කය | ................................ | 1.2 | ප්‍රාදේශීයලේකම් කොට්ඨාශය | ............................ |
| 1.3 | අදාල ප්‍රජාමූල බැංකු සමිතිය | ................................ | 1.4 | කලාපය | ............................ |
| 1.5 | ග්‍රාම නිලධාරී වසම | ................................ | 1.6 | සමෘද්ධි බැංකු සංගමය | ............................ |

1.7ග්‍රාම නිලධාරී වසම භාර සමෘද්ධි සංවර්ධන නිලධාරියාගේ නම හා දුරකථන අංකය:- ........................................................................................................................................

2.0 පවුල පිළිබඳ මූලික තොරතුරු:

| අනු අංකය | සම්පූර්ණ නම | ගෘහ මූලිකයාට ඇති නෑදෑකම | ස්ත්‍රී/ පුරුෂ භාවය | වයස (අවු:) | විවාහක/ අවිවාහක බව | අධ්‍යාපන මට්ටම | රැකියාව | පු.ලි.දෙ. හැඳුනුම්පත් අංකය |
|---|---|---|---|---|---|---|---|---|
| | | | | | | | | |
| | | | | | | | | |
| | | | | | | | | |

2.1 සමෘද්ධි සහනාධාරලාභියෙක් ද ? ....................................

2.2 සමෘද්ධි සහනාධාරලාභියෙක් නම් සහනාධාරයේ වටිනාකම රු:-...............................................

2.3 වෙනත් මහජන ආධාර ලැබෙන්නේ නම් එම ආධාරය හා වටිනාකම:-.........................................

2.4 දුරකථනයක් ඇත්නම් අංකය:-……………………………………………………

2.5.වෙනත් විශේෂිත තොරතුරු:-..........................................................

| ඇත | | නැත | |
|---|---|---|---|

3.0 සනීපාරක්ෂක ජල මුද්‍රිත වැසිකිළියක්:-

ඉහත තොරතුරු සත්‍ය හා නිවැරදි බවටත්, වැසිකිළි ආධාරය ලැබීමෙන් අනතුරුව වැසිකිළි ඉදිකර ගැනීම සඳහා කැපවී කටයුතු කරන බවටත් සහතික වෙමි.

| | |
|---|---|
| .................................... | ..................................... |
| දිනය | අයදුම්කරුගේ අත්සන |

| | | |
|---|---|---|
| ග්‍රාම නිලධාරි වසම භාර සමෘද්ධි සංවර්ධන නිලධාරි නිර්දේශය | අදාල ප්‍රජාමූල සමිතියේ සභාපතිගේ නිර්දේශය | අදාල කලාප කළමනාකරු නිර්දේශය |
| නම.................................. | නම................................ | නම................................ |
| අත්සන.............................. | අත්සන............................ | අත්සන............................ |
| දිනය................................. | දිනය............................... | දිනය.............................. |
| මූලස්ථාන කළමනාකරු/කළමනාකාර අධ්‍යක්ෂගේ නිර්දේශය | ප්‍රාදේශීය ලේකම්ගේ නිර්දේශය | දිස්ත්‍රික් ලේකම්/දිස්ත්‍රික් සමෘද්ධි අධ්‍යක්ෂගේ අනුමැතිය |
| නම.................................. | නම................................ | නම................................ |
| අත්සන.............................. | අත්සන............................ | අත්සන............................ |
| දිනය................................. | දිනය............................... | දිනය.............................. |

## 07. සමෘද්ධි සහනාධාරලාභී හා අඩු ආදායම්ලාභී සමෘද්ධි බැංකු සාමාජිකයින් සඳහා ගෘහස්ථ විදුලිය ලබාදීමේ වැඩ සටහන :-

2021 අයවැය යෝජනා අනුව සෑම නිවසකටම විදුලිය ලබාදීමේ සඳහා යෝජිත වැඩ සටහන සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව මඟින් දැනටමත් සැලසුම් කර ඇත. ඒ සඳහා මීට පෙර නිකුත් කර ඇති සමෘද්ධි ප්‍රජාමුල බැංකු චක්‍රලේඛ 2021/03 ට අනුව පවුල් හඳුනා ගැනිම මේ වන විටත් සිදු කර ඇත.
එම චක්‍රලේඛයේ සඳහන් පරිදි සමීක්ෂණයෙන් තහවුරු කර ගත් පවුල් සඳහා විදුලිබල මණ්ඩලය මේ වන විටත් විදුලි සම්බන්ධතාවය ලබාදීමට කටයුතු කරන අතර, අදාල පවුල් ඒ සඳහා සුදානම් කරවීම සඳහා සමාජ සංවර්ධන සහකාර, ක්ෂේත්‍ර සහකාර සහ වසම්භාර සමෘද්ධි නිලධාරින් මැදිහත් වි යුතු අතර ඒ ඒ අවස්ථානුකූලව ඔවුන් වෙත පැවරී ඇති කාර්යයන් ද එහි විස්තර කර ඇත.
ඒ අනුව දැනට විදුලි බලය නොමැති බවට හඳුනා ගෙන ඇති පවුල් සඳහා අභ්‍යන්තර විදුලි රැහැන් ඇදීම සඳහා අවශ්‍ය සේවා ස්ථාන හා අදාල පුද්ගලයින් සහභාගි කරවමින් එම කාර්යය කාර්යක්ෂමව කරවීම හා අවශ්‍ය අවස්ථාවන් වලදී ප්‍රජාමුල සමිති සම්බන්ධීකරණය සඳහා සමාජ සංවර්ධන සහකාරවරුන්ගේ මැදිහත්වීම අවශ්‍ය වේ.
මෙම වැඩසටහන කඩිනමින් නිම කළ යුතු හෙයින් ඒ සඳහා ප්‍රමුඛතාවය ලබා දෙන ලෙස වැඩිදුරටත් දන්වමි. මාර්තු මස 15 දින වන විට සියළුම සමෘද්ධිලාභී හා අඩු ආදායම්ලාභී බැංකු සාමාජිකයින් හට අවශ්‍ය සියළු පහසුකම් ලබාදීමට ක්‍රියා කළ යුතුය. එමෙන් ම අප්‍රේල් මස අවසන්වීමට පෙර මෙම සියළුම නිවාස සඳහා විදුලිය ලබාදීමට විදුලි බල මණ්ඩලය ක්‍රියා කරන බැවින් එම නිවාසවල විදුලි පද්ධතිය සකස් කිරිමට ඊට පෙර පියවර ගත යුතුය.
ඒ සඳහා ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු (VTA ) ජාතික ආධුනිකත්ව හා පුහුණු කිරිම් අධිකාරිය (NAITA) සහ විදුලි බල මණ්ඩලයේ ලියාපදිංචි සහතිකය ලත් අයගෙන් මෙම විදුලි පද්ධති සැකසීමට කටයුතු කරන ලෙස වැඩිදුරටත් දන්වමි.
මේ සඳහා ඇමුණුම අංක 12 පරිදි තොරතුරු වාර්තා කළ යුතු වේ.

ඇමුණුම 09

<u>සමාජ සංවර්ධන පුහුණු වැඩසටහන් ක්‍රියාත්මක</u>
<u>කිරීම සඳහා සුදුසු පුද්ගලයන් හඳුනා ගැනීමේ අකෘතිය</u>

1. ප්‍රාදේශිය ලේකම් කොට්ඨාශය:-

2. ග්‍රාම නිළධාරි වසම:-

3. ගෘහ මූලිකයාගේ නම:-

4.ගෘහ මූලිකයාගේ වයස:-

5. පවුලේ මුළු සමාජීක සංඛ්‍යාව :-

6. ලිපිනය:-

7. රැකියාවේ ස්වභාවය:-

8.පවුල මුහුණ දෙන සමාජීය ගැටළු

| අංකය | ගැටළුවේ ස්වභාවය | ඔව් | නැත | දෛනික වියදම රු:- |
|---|---|---|---|---|
| 1 | මත්ද්‍රව්‍ය දුම්වැටි භාවිතා කරන පවුලකි | | | |
| 2. | විවිධාකාරයේ මානසික ගැටළුවලට මුහුණ දී ඇති පවුලකි | | | |
| 3 | බෝනොවන රෝගවලින් පෙළෙන සමාජීකයන් ඇති පවුලකි | | | |

(ඉහත අකෘතිය සම්පූර්ණ කිරීමේ දී අදාල පුද්ගලයා සමඟ සාකච්ඡා කර කරුණු පැහැදිලි කර දි නිවැරැදි තොරතුරු ලබාගැනීම ඵලදායි පුහුණු වැඩසටහන් සැළසුම් කිරීමට බෙහෙවින් ඉවහල් වේ. )

ඉහත සඳහන් තොරතුරු නිවැරැදි බව තහවුරු කරමි.

# සමාජ සංවර්ධන වැඩසටහන - 2021

**ඇමුණුම 08**

## එක් එක් විෂයයන් සඳහා දිස්ත්‍රික් මට්ටමින් ප්‍රතිපාදන වෙන් කිරිම

| අනු අංකය | දිස්ත්‍රික්කය | මත්ද්‍රව්‍ය හා දුම්වැටි නිවාරණ වැඩසටහන | කායික හා මානසික රෝග අවම කිරිමේ වැඩසටහන | බෝ නොවන රෝග අවම කිරිම සඳහා දේශීය ආහාර ප්‍රවර්ධන වැඩසටහන | සමෘද්ධි කැකුළු ළමා සමාජ වැඩ සටහන් | | දිරිය පියස නිවාස වැඩසටහන | | සනීපාරක්ෂක වැසිකිලි වැඩ සටහන | | ප්‍රගති සමාලෝචන වැඩ මුළු |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | | දිස්ත්‍රික් තරඟ | පුස්තකාල | මුදල | සංඛ්‍යාව | මුදල | සං ඛ්‍යාව | |
| 1 | කොළඹ | 390,000.00 | 390,000.00 | 390,000.00 | 97,500.00 | 75,000.00 | 1,200,000.00 | 6 | 600,000.00 | 20 | 49,600.00 |
| 2 | ගම්පහ | 390,000.00 | 390,000.00 | 390,000.00 | 97,500.00 | 75,000.00 | 1,400,000.00 | 7 | 600,000.00 | 20 | 48,000.00 |
| 3 | කළුතර | 420,000.00 | 420,000.00 | 420,000.00 | 105,000.00 | 100,000.00 | 1,400,000.00 | 7 | 630,000.00 | 21 | 51,200.00 |
| 4 | මහනුවර | 600,000.00 | 600,000.00 | 600,000.00 | 150,000.00 | 125,000.00 | 2,000,000.00 | 10 | 900,000.00 | 30 | 73,600.00 |
| 5 | මාතලේ | 330,000.00 | 330,000.00 | 330,000.00 | 82,500.00 | 75,000.00 | 1,200,000.00 | 6 | 480,000.00 | 16 | 43,200.00 |
| 6 | නුවරඑළිය | 150,000.00 | 150,000.00 | 150,000.00 | 37,500.00 | 25,000.00 | 600,000.00 | 3 | 210,000.00 | 7 | 20,800.00 |
| 7 | ගාල්ල | 570,000.00 | 570,000.00 | 570,000.00 | 142,500.00 | 125,000.00 | 2,000,000.00 | 10 | 840,000.00 | 28 | 68,800.00 |
| 8 | මාතර | 480,000.00 | 480,000.00 | 480,000.00 | 120,000.00 | 100,000.00 | 1,600,000.00 | 8 | 720,000.00 | 24 | 56,000.00 |
| 9 | හම්බන්තොට | 360,000.00 | 360,000.00 | 360,000.00 | 90,000.00 | 75,000.00 | 1,200,000.00 | 6 | 540,000.00 | 18 | 44,800.00 |
| 10 | යාපනය | 450,000.00 | 450,000.00 | 450,000.00 | 112,500.00 | 100,000.00 | 1,400,000.00 | 7 | 630,000.00 | 21 | 54,400.00 |
| 11 | මන්නාරම | 150,000.00 | 150,000.00 | 150,000.00 | 37,500.00 | 25,000.00 | 400,000.00 | 2 | 390,000.00 | 13 | 20,800.00 |
| 12 | වව්නියාව | 120,000.00 | 120,000.00 | 120,000.00 | 30,000.00 | 25,000.00 | 400,000.00 | 2 | 180,000.00 | 6 | 16,000.00 |
| 13 | මුලතිව් | 180,000.00 | 180,000.00 | 180,000.00 | 45,000.00 | 50,000.00 | 600,000.00 | 3 | 270,000.00 | 9 | 24,000.00 |
| 14 | කිලිනොච්චිය | 120,000.00 | 120,000.00 | 120,000.00 | 30,000.00 | 25,000.00 | 400,000.00 | 2 | 180,000.00 | 6 | 17,600.00 |
| 15 | මඩකලපුව | 420,000.00 | 420,000.00 | 420,000.00 | 105,000.00 | 100,000.00 | 1,400,000.00 | 7 | 630,000.00 | 21 | 51,200.00 |
| 16 | අම්පාර | 600,000.00 | 600,000.00 | 600,000.00 | 150,000.00 | 125,000.00 | 2,000,000.00 | 10 | 900,000.00 | 30 | 68,800.00 |
| 17 | ත්‍රිකුණාමලය | 330,000.00 | 330,000.00 | 330,000.00 | 82,500.00 | 75,000.00 | 1,000,000.00 | 5 | 480,000.00 | 16 | 40,000.00 |
| 18 | කුරුණෑගල | 900,000.00 | 900,000.00 | 900,000.00 | 225,000.00 | 200,000.00 | 3,000,000.00 | 15 | 1,350,000.00 | 45 | 100,800.00 |
| 19 | පුත්තලම | 480,000.00 | 480,000.00 | 480,000.00 | 120,000.00 | 100,000.00 | 1,600,000.00 | 8 | 720,000.00 | 24 | 56,000.00 |
| 20 | අනුරාධපුරය | 660,000.00 | 660,000.00 | 660,000.00 | 165,000.00 | 150,000.00 | 2,200,000.00 | 11 | 1,020,000.00 | 34 | 75,000.00 |
| 21 | පොළොන්නරුව | 210,000.00 | 210,000.00 | 210,000.00 | 52,500.00 | 50,000.00 | 800,000.00 | 4 | 360,000.00 | 12 | 28,800.00 |
| 22 | බදුල්ල | 450,000.00 | 450,000.00 | 450,000.00 | 112,500.00 | 100,000.00 | 1,600,000.00 | 8 | 660,000.00 | 22 | 54,400.00 |
| 23 | මොණරාගල | 330,000.00 | 330,000.00 | 330,000.00 | 82,500.00 | 75,000.00 | 1,200,000.00 | 6 | 480,000.00 | 16 | 40,000.00 |
| 24 | රත්නපුරය | 510,000.00 | 510,000.00 | 510,000.00 | 127,500.00 | 100,000.00 | 1,800,000.00 | 9 | 750,000.00 | 25 | 59,200.00 |
| 25 | කෑගල්ල | 330,000.00 | 330,000.00 | 330,000.00 | 82,500.00 | 75,000.00 | 1,200,000.00 | 6 | 480,000.00 | 16 | 41,600.00 |
| මුළු එකතුව | | **9,930,000.00** | **9,930,000.00** | **9,930,000.00** | **2,482,500.00** | **2,150,000.00** | **33,600,000.00** | **168** | **15,000,000.00** | **500** | **1,204,600.00** |

ඇමුණුම අංක **10**

**සමාජ සංවර්ධන වැඩසටහන - 2021**

**භාණ්ඩාගාර ප්‍රතිපාදන**

**2021............................ දිනට ප්‍රගතිය**

**දිස්ත්‍රික් කාර්යාලය......................................**

| අනු අංකය | වැඩසටහන | වාර්ෂික සැලැස්මට අනුව ඉලක්කය | | පෙර මස දක්වා ක්‍රියාත්මක කළ සමස්ථ වැඩසටහන් | | | අදාල මාසය තුළ ක්‍රියාත්මක කළ වැඩසටහන් | | | සමස්ථ ප්‍රගතිය | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | භෞතික | මූල්‍ය රු. | වැඩසටහන් සංඛ්‍යාව | වියදම රු. | සහභාගි වූ සංඛ්‍යාව | වැඩසටහන් සංඛ්‍යාව | වියදම රු | සහභාගි වූ සංඛ්‍යාව | වැඩසටහන් සංඛ්‍යාව | වියදම රු | සහභාගි වූ සංඛ්‍යාව |
| | | | | | | | | | | | | |
| | | | | | | | | | | | | |
| | | | | | | | | | | | | |
| | | | | | | | | | | | | |
| | | | | | | | | | | | | |
| | | | | | | | | | | | | |
| | | | | | | | | | | | | |
| | | | | | | | | | | | | |
| එකතුව | | | | | | | | | | | | |

සකස් කළේ............................
දිස්ත්‍රික් සමෘද්ධි නිලධාරී

පරීක්ෂා කළේ............................
විෂය කළමනාකරු

අනුමත කළේ.................................
දිස්ත්‍රික් සමෘද්ධි අධ්‍යක්ෂ

ඇමුණුම අංක **11A**

**සමාජ සංවර්ධන වැඩසටහන - 2021**

**දිරිය පියස නිවාස වැඩසටහන**

**2021............................ දිනට ප්‍රගතිය**

**දිස්ත්‍රික්කය -**

| අනු අංකය | ප්‍රාදේශිය ලේකම් කොට්ඨාසය | අනුමත නිවාස සංඛ්‍යාව | ප්‍රතිපාදන රු. | | ඉදිකිරීම් ආරම්භ කර | | වියදම **2021............** දිනට රු. | අදියර මට්ටම් | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | ලබාදී ඇති | ලබාදී නැති | ඇති නිවාස සංඛ්‍යාව | නැති නිවාස සංඛ්‍යාව | | **i** | **ii** | **iii** | **iv** |
| | | | | | | | | | | | |
| | | | | | | | | | | | |
| | | | | | | | | | | | |
| | | | | | | | | | | | |
| | | | | | | | | | | | |
| | | | | | | | | | | | |
| | | | | | | | | | | | |
| | | | | | | | | | | | |
| | | | | | | | | | | | |
| | | | | | | | | | | | |
| | | | | | | | | | | | |
| එකතුව | | | | | | | | | | | |

සකස් කළේ...................................
දිස්ත්‍රික් සමෘද්ධි නිලධාරී

පරීක්ෂා කළේ........................
විෂය කළමනාකරු

අනුමත කළේ..........................
දිස්ත්‍රික් සමෘද්ධි අධ්‍යක්ෂ

ඇමුණුම 11 B

**සමාජ සංවර්ධන වැඩසටහන - 2021**

**සමෘද්ධිලාභී හා අඩු ආදායම්ලාභීන් සඳහා සනීපාරක්ෂක වැසිකිළි පහසුකම් සැපයීම**

**2021.................... දිනට ප්‍රගතිය**

දිස්ත්‍රික්කය ......................................................................

| අනු අංකය | ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය | අනුමත වැසිකිළි සංඛ්‍යාව | ප්‍රතිපාදන රු. | | ඉදිකිරීම් ආරම්භ කර | | වියදම 2021.......... දිනට රු. | අදියර මට්ටම | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | ලබා දී ඇති | ලබා දී නැති | ඇති වැසිකිළි සංඛ්‍යාව | නැතිවැසිකිළි සංඛ්‍යාව | | i | ii | ඉදිකර අවසන් |
| | | | | | | | | | | |
| | | | | | | | | | | |
| | | | | | | | | | | |
| | | | | | | | | | | |
| | | | | | | | | | | |
| | | | | | | | | | | |
| | | | | | | | | | | |

සකස් කළේ.................................. පරික්ෂා කළේ................................ අනුමත කළේ..................................

දිස්ත්‍රික් සමෘද්ධි නිලධාරි   විෂය කළමනාකරු   දිස්ත්‍රික් සමෘද්ධි අධ්‍යක්ෂ

ඇමුණුම 12

# සමෘද්ධි සහනාධාරලාභී හා අඩුආදායම්ලාභී සමෘද්ධි බැංකු සාමාජිකයින් සඳහා ගෘහස්ථ විදුලිය ලබාදීමේ වැඩසටහන - 2021

දිස්ත්‍රික්කය .......................................

| අනු අංකය | ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය | කලාපය | වසම | සමෘද්ධිලාභී/අඩුආදායම්ලාභී යන වග | ප්‍රතිලාභියාගේ නම | ලිපිනය | අවශ්‍ය ණය මුදල (රු) |
|---|---|---|---|---|---|---|---|
| | | | | | | | |
| | | | | | | | |
| | | | | | | | |
| | | | | | | | |
| | | | | | | | |
| | | | | | | | |
| | | | | | | | |
| | | | | | | | |
| | | | | | | | |
| | | | | | | | |
| | | | | | | | |
| | | | | | | | |
| | | | | | | | |
| | | | | | | | |
| | | | | | | | |

සකස් කළේ ....................................
දිස්ත්‍රික් සමාජ සංවර්ධන නිලධාරී

පරීක්ෂා කළේ.........................
විෂය කළමණාකරු

අනුමත කළේ..........................
දිස්ත්‍රික් සමෘද්ධි අධ්‍යක්ෂ